ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය

කොළඹ

***

<u>පුවත්පත් නිවේදනය</u>

**<u>නියෝජ්‍ය මහ කොමසාරිස් විනෝද් කේ. ජේකබ් මහතා 2023 ජූලි 7 වන දින කොළඹ දී ඉදිකිරීම්, විදුලි සහ බලශක්ති ප්‍රදර්ශනය - 2023 විවෘත කළ අවස්ථාවේ දී පළ කළ අදහස්</u>**

අද දින කොළඹ දී ඉදිකිරීම්, විදුලි සහ බලශක්ති ප්‍රදර්ශනය - 2023 සමාරම්භක උත්සවයට සහභාගී වීම මට ගෞරවයක්. ප්‍රථමයෙන්ම මේ සම්බන්ධයෙන් සංවිධායකවරුන්ට සුබ පැතුම් එක් කිරීමට කැමතියි. 50කට ආසන්න ඉන්දියානු සමාගම් මහත් උනන්දුවකින් මේ සඳහා සහභාගී වන අතර විශේෂයෙන්ම එය මා හට දිරිගැන්වීම ක්. මෙය ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර පවතින ශක්තිමත් ආර්ථික සහ වාණිජ සබඳතා සඳහා සාක්ෂියකි.

පසුගිය වසර තුන තුළ ඉන්දියාවේ සහ ශ්‍රී ලංකාවේ ජනතාව අතර සමීප සබඳතා මනාව විදහා දැක්වුණා. ශ්‍රී ලංකාව කොවිඩ් වසංගතයේ අභියෝග, ආර්ථික අර්බුදය සහ දේශපාලන කැළඹීම්වලට මුහුණ දුන් අවස්ථාවක ඉන්දීය රජයේ “අසල්වැසියා ප්‍රථමයෙන්” යන ප්‍රතිපත්තිය අනුව ඉන්දීය මහ කොමසාරිස් කාර්යාලය ශ්‍රී ලංකාවේ ආර්ථික සහ සමාජ අංශයන්ට ස්ථිරසාරව සහයෝගය ලබා දුන්නා.

ඇමරිකානු ඩොලර් බිලියන 4ක් වන ඉන්දියාවේ මූල්‍ය සහ මානුෂීය සහයෝගය ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් අපේක්ෂිත සමස්ත අරමුදල් පහසුකම ද ඉක්මවනවා. මෙම වසරේ ජනවාරි මාසයේ දී IMF ක්‍රමවේදය ආරම්භ කිරීම සඳහා මූල්‍ය සහතිකය ලබා දුන් ප්‍රථම ණයහිමි රාජ්‍යය වූයේ ද අප යි. ඉන්දියාව, ජපානය සහ පැරිස් සමාජය හා එක්ව ණයහිමි කමිටුවේ

සම සභාපතිත්වය හිමි රාජ්‍යය වශයෙන් තවදුරටත් අර්ථකාරී භූමිකාවක් ඉටු කරනු ඇති.

මෙම වසරේ ජනවාරි මාසයේ දී විදේශ කටයුතු අමාත්‍ය එස්. ජයිශංකර් මහතා විසින් සිදු කරන ලද සාර්ථක සංචාරය යටිතල පහසුකම්, නිෂ්පාදන සහ සම්බන්ධකතාවය ප්‍රවර්ධනය යන ක්ෂේත්‍රවල ආයෝජන හරහා සහයෝගීතාවය තවදුරටත් ඉහළ නැංවීමට මං පෙත් විවර කළා. 2022 වසරේ දී ශ්‍රී ලංකාවේ විශාලතම වෙළඳ සහකරු වූයේ ඉන්දියාව යි. ඉන්දියාව වෙත යැවෙන ශ්‍රී ලංකාවේ අපනයන  ඉහළ ගොස් තිබෙනවා. වෙළඳ පියවීම් සඳහා ඉන්දියානු රුපියල භාවිතා කිරීම ශ්‍රී ලංකාවේ ආර්ථිකයට තවදුරටත් උපකාරී වෙනවා. මේවා ශ්‍රී ලංකාවේ ආර්ථික ප්‍රතිසාධනය සහ වර්ධනයට ඉවහල් වන සවිමත් පියවර වෙනවා.

සංචාරකයන් 100,000කට අධික සංඛ්‍යාවක් සමඟින් ඉන්දියාව නැවතත් ශ්‍රී ලංකාවට වැඩිම සංචාරකයන් පිරිසක් පැමිණෙන රට බවට පත් වී ඇති බව මා සඳහන් කරන්නේ සතුටින්. ශ්‍රී ලංකාවට පැමිණෙන සෑම සංචාරකයින් පස් - හය දෙනෙකුටම කෙනෙක් ඉන්දියානුවෙක්.

චෙන්නායි සහ යාපනය අතර ගුවන් ගමන් නැවතත් ඇරඹීම දෙරට ජනතාව වඩා සමීප කිරීම සඳහා ගත් තවත් පියවරක්. දෙරට අතර බෝට්ටු සේවා මෙය තවදුරටත් ඉහළ නංවනු ඇති. මෙම සන්දර්භය තුළ සම්බන්ධකතාවය බලපෑම් ගුණකයක්. 1990 සුවසැරිය ගිලන්රථ සේවාව, ඉන්දියානු නිවාස ව්‍යාපෘතිය, පාසල් ප්‍රතිසංස්කරණය කිරීම, රෝහල් ඉදිකිරීම සහ වෙනත් සමාජ-ආර්ථික ව්‍යාපෘති වැනි ප්‍රයෝජනවත් පොදු භාණ්ඩ ශ්‍රී ලංකාවට ලබා දුන් සංවර්ධන සහයෝගීතාවයට මෙය රුකුලක් වනු ඇති.

ඉන්දියා - ශ්‍රී ලංකා බැඳීම් හි මෑත කාලීන වර්ධනයන් අපගේ මිත්‍රත්වය සහ සමස්ත සහයෝගීතාවය ශක්තිමත් කර තිබෙනවා. මේ අතරම දෙරට විශේෂයෙන්ම සමුද්‍රීය ආරක්ෂක ක්ෂේත්‍රය තුළ පොදු අභියෝගයන්ට මුහුණ දීම සඳහා අවධානයෙන් පසු වෙනවා.

මෙම ප්‍රදර්ශනයට සහභාගී වන්නන් මෙම පසුබිම සිත් හි තබා ගෙන වර්තමානයේ දී පසුගිය වසර 75ටම වඩා ඉහළම මට්ටමක පවතින ඉන්දියා - ශ්‍රී ලංකා මිත්‍රත්වය තවදුරටත් ශක්තිමත් කිරීම උදෙසා දැඩි ප්‍රයත්නයකින් කටයුතු කරනු ඇතැයි ද මා අපේක්ෂා කරනවා. අප මෙම අවධියට ළඟා වී ඇත්තේ ජනතාව, ව්‍යාපාර කවයන් සහ ඉන්දීය රජය මෙම අවස්ථාවේ දී ශ්‍රී ලංකාව සමඟ ශක්තිමත්ව රැඳී සිටීමට අදිටන් කරගෙන සිටීම නිසායි.

ස්තුතියි!

***

කොළඹ
2023 ජූලි 07